

උඟ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



පෙරහුරු පරීක්ෂණය - 2025(2026)

11 ශ්‍රේණිය	කෘෂි හා ආහාර තාක්ෂණය I,II	කාලය: පැය 03 යි.

සැලකිය යුතුයි

(i) **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන** හෝ පිළිතුර තෝරන්න.

01. ශ්‍රී ලංකාවේ පැවති දියුණු වාරි තාක්ෂණයට හොඳම නිදසුනක් නම් යෝධ ඇළ නිර්මාණයයි. මෙම ඇළ ඉදිකරන ලද්දේ,

1) ධාතුසේන රජතුමා ය. 2) මහා පරාක්‍රමබාහු රජතුමා ය.

3) වසභ රජතුමා ය. 4) මහසෙන් රජතුමා ය.

02. මෝසම් වර්ෂාව මඟින් ප්‍රධාන ව ලංකාවට වර්ෂාපතනය ලැබේ. එයින් පළමුවන අන්තර් මෝසම් වැසි ලැබෙන කාල සීමාව වනුයේ ,

1) ඔක්තෝම්බර් -නොවැම්බර් 2) මාර්තු - අප්‍රේල්

3) මැයි - සැප්තැම්බර් 4) දෙසැම්බර් -පෙබරවාරි

03. නව ශාක ප්‍රභේද අභිජනනයේ දී දින උදාසීන ශාක බිහිකිරීම වැදගත් වන්නේ එම ප්‍රභේද,

1) පොහොරවලට වැඩි ප්‍රතිචාරයක් දක්වන නිසා ය

2) වැඩි අස්වැන්නක් ලබා දෙන නිසා ය

3) වසරේ ඕනෑම කාලයක වගා කර අස්වැන්න ලබා ගැනීමට හැකි නිසා ය

4) පළිබෝධ හානිවලට ප්‍රතිරෝධී නිසා ය

04. පාංශු කලිල සංකීර්ණය සෑදීමට දායක වන්නේ,

1) මැටි හා වැලි ය 2) හියුමස් හා මැටි ය

3) හ්‍යුමස් හා වැලි ය 4) රොන්මඩ හා සියුම් වැලි ය

05. පසේ ආම්ලිකතාවය අඩු කිරීමට පසට යොදනු ලබන්නේ,

1) ඩොලමයිට් ය. 2) ගෙන්දගම් ය.

3) ජිප්සම් ය. 4) යූරියා ය.

06. දර්ශීය පාංශු පැතිකඩක විශෝධන කලාපය ලෙස හඳුන්වන්නේ,

1) A කලාපය යි. 2) B කලාපය යි.

3) C කලාපය යි. 4) R කලාපය යි.

07. දැනට ශ්‍රී ලංකාවේ විශාල ආදායමක් ලබා දෙන පුවක් බෝගය අයත්වන කුලය නම්,

1) මැල්වේසියේ කුලයට. 2) ඇරකේසියේ කුලයට.

3) සොලනේසියේ කුලයට 4) ෆැබේසියේ කුලයට

08. අතුරුයත් ගෑමට අයත් වන්නේ,

1) පස පෙරළීම
2) කැට පොඩි කිරීම
3) පෝරු ගෑම
4) කාණුවල පස් ඉවත්කිරීම

09. තවාන් පාත්තිය පිළිස්සීම මඟින් ලබා ගත හැකි වාසියක් වනුයේ,

1) පසට ක්ෂුද්‍ර පෝෂක එකතු වීම යි
2) පසට කාබනික ද්‍රව්‍ය එකතු වීම යි
3) පසේ භෞතික ගුණාංග දියුණු වීම යි
4) පාංශු රෝග කාරක ජීවීන් විනාශ වීම යි

10. වර්තමානයේ වැසි ජලය මිනිසාගේ ගෘහස්ථ පරිභෝජනය සඳහා එක්රැස් කර තබා ගැනේ. මේ සඳහා තම නිවසේ පෝෂක ප්‍රදේශය වන්නේ,

1) ගෙවත්ත
2) වහලය
3) ඉඩමය
4) මිදුලය

11. ජල වහනය දුර්වල මැටි පසකට වඩාත් යෝග්‍ය බෝග කාණ්ඩය වන්නේ,

1) කංකුං හා කොහිල ය
2) මිරිස් හා මාළු මිරිස් ය
3) වැටකොළු හා පතෝල ය
4) වම්බටු හා තක්කාලි ය

12. බෝගවගාවේ දී පොහොර භාවිත කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වැදගත්වන සාධක කිහිපයක් පහත දැක්වේ.

A – වගාවේ අවස්ථාවට සුදුසු පොහොර වර්ග තෝරා ගැනීම.

B – වගා කර ඇති බෝගය.

C – පසේ අඩංගු පෝෂක ප්‍රමාණය.

D – සුදුසු පොහොර යෙදීමේ ක්‍රම අනුගමනය කිරීම.

මේවායින් සත්‍ය ප්‍රකාශ වන්නේ,

1) A හා B පමණි
2) B හා C පමණි
3) A,B හා D පමණි
4) A,C හා D පමණි


13. ශාකයක මනා වර්ධනය සඳහා වායුගෝලයෙන් ලැබෙන මහා පෝෂක වනුයේ,

1) කාබන් හා ඔක්සිජන් ය
2) කාබන් හා සල්ෆර් ය
3) කාබන් හා නයිට්‍රජන් ය
5) කැල්සියම් හා කාබන් ය

14. කුකර්බිටේසියේ කුලයේ බෝගවල පැළ ලබා ගැනීම සඳහා වඩාත් සුදුසු තවාන් ක්‍රමය කුමක්ද?

1) උස් තවාන්
2) නොරිදෝකෝ තවාන්
3) ගිල්වූ තවාන්
4) බඳුන් තවාන්

15. මෙහි ඇති රූපයෙන් දැක්වෙන බිම් සැකසීමේ උපකරණය කුමක්ද?



1) ජපන් පරිවර්ත්‍ය නඟුල
2) රොටවේටරය
3) හැඩලෑලි නඟුල
4) දැති පෝරුව

16. පහත දැක්වෙන්නේ ජල සම්පාදනය පිළිබඳ වගන්ති කිහිපයකි.

A – ජල මූලාශ්‍රයක් මගින් බෝග වලට ජලය සැපයීම ජල සම්පාදනය යි

B – ජල සම්පාදනයේ දී බෝගවල වර්ධන අවධිය පිළිබඳ සැලකිල්ලක් නොදක්වයි.

C – පෘෂ්ඨීය ජල සම්පාදනයේ දී ජලය අපතේ යාම වැඩිය

මේ අතරින් නිවරදි වනුයේ,

1) A හා B ය
2) B හා C ය
3) A හා C ය
4) A,B හා C ය

17.බිංදු ජල සම්පාදනයේ අවාසියක් වන්නේ.

1) ජල සම්පාදනයේ කාර්යක්ෂමතාවය වැඩිය.
2) ඉහළ තාක්ෂණික දැනුමක් අවශ්‍ය වේ.
3) වල් පැළ වර්ධනය පාලනය වේ.
4) ඕනෑම භූමියකට සුදුසු වේ.

18. පසේ ඇති ජලය, පසේ ඉතා පහළ ස්ථර කරා කාන්දු වීම හඳුන්වන්නේ,

1) පෘෂ්ඨීය අපදාව ලෙස ය
2) ගැඹුරු වෑස්සීම ලෙස ය
3) ජල වහනය ලෙස ය
4) වාෂ්පීකරණය ලෙස ය

19. පත්‍ර විචිත්‍ර වෛරස් රෝගයේ ධාරක ශාකයක් ලෙස ක්‍රියාකරනුයේ පහත සඳහන් වල් පැළෑටි අතුරෙන් කුමක්ද?

1) ගඳපාන
2) පාතිනියම්
3) හුලංතලා
4) දිය සියඹලා

20. බඩ ඉරිඟු වගාවක මේරූ පත්‍ර දම් පැහැ ගැන්වී ඇති බවත්, එම තත්ත්වය ලපටි පත්‍ර දක්වා විහිදී ඇති බවත් දක්නට ලැබුණි. මෙම ලක්ෂණය අනුව ඌනතාවයක් වී ඇත්තේ කුමන පෝෂකය ද?

1) කැල්සියම් (Ca)
2) නයිට්‍රජන් (N)
3) මැග්නීසියම් (Mg)
4) පොස්පරස් (P)

21. විවිධ වී ප්‍රභේදවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A – ශාකය උසින් වැඩිය

B – පඳුරු දැමීම වැඩිය

C – අස්වැන්න වැඩිය

D – ප්‍රභා අවධි සංවේදීතාවය පෙන්වයි

ඉහත ලක්ෂණ අතුරෙන් වැඩි දියුණු කරන ලද වී ප්‍රභේදවල දැකිය හැක්කේ,

1) A හා B පමණි
2) A හා C පමණි
3) C හා D පමණි
4) B හා C පමණි

22. ත්‍රිත්ව සුපර් පොස්පේට්වල අඩංගු පොස්පරස් ප්‍රතිශතය කුමක්ද?

1) 20%
2) 27%
3) 45%
4) 60%

23. වී බෝගයේ දී පීදීමේ අවස්ථාවේ සිට කරල් මේරීමේ අවස්ථාව දක්වා ගතවන දින ගණන,

1) 30 කි
2) 45 කි
3) 50 කි
4) 60 කි

24. බීජ වර්ගය හා එහි සුප්තතාවයට හේතුව නිවැරදිව දැක්වෙන වරණය පහත වගුවෙන් තෝරන්න.

	බීජ වර්ගය	සුප්තතාවයට හේතු
1)	පැපොල්	ඝන බීජාවරණයක් තිබීම
2)	තක්කාලි	නිෂේධක ද්‍රව්‍ය තිබීම
3)	ඕකිඩ්	අපාරගම්‍ය බීජාවරණයක් තිබීම
4)	තේක්ක	නොමේරූ කලලයක් තිබීම

25. එකම භූමියක එකම අවස්ථාවක අක්‍රමවත්ව බෝග දෙකක් හෝ වැඩි ගණනක් වගා කිරීම හඳුන්වන්නේ,

1) මිශ්‍ර බෝග වගාව ලෙස ය.
2) අතුරු බෝග වගාව ලෙස ය.
3) කඩින් කඩ බෝග වගාව ලෙස ය.
4) වීදි බෝග වගාව ලෙස ය

26. පාලිත තත්ත්ව යටතේ බෝග වගාවේ දී යොදා ගැනෙන තාවකාලික ආරක්ෂිත වගා ව්‍යූහයකට නිදසුනක් වනුයේ,

1) පොලිතින් උමංය
2) දැල් ගෘහය
3) සූර්යය ප්‍රචාරකය
4) වීදුරු ගෘහය

27. ශරීරයේ ඊයම් තැන්පත්වීම නිසා රෝගී තත්ත්ව ඇතිවිය හැක්කේ පහත දැක්වෙන කුමන ආහාර නිතර පරිභෝජනය කිරීමෙන්ද?

1) පරිරක්ෂක යෙදූ බීම වර්ග
2) තක්කාලි සමඟ ඒකට පිසින ලද හාල්මැස්සන්
3) නැවම් බවෙන් තොර බල මාළු
4) තෙලෙහි බැද පුවත්පත්වල ඔතා තැබූ ආහාර

28. ජෑම් නිෂ්පාදනයේ දී යොදා ගනු ලබන ප්‍රධාන ආහාර පරිරක්ෂක ක්‍රමය වනුයේ,

1) සාන්ද්‍රීකරණය යි
2) අවම සැකසීම යි
3) උෂ්ණත්ව පාලනය යි
4) පැසවීම යි

29. වියළීම සඳහා එළවළු කැපූ විගස ඒවා බ්ලාන්චිකරණය කරනු ලැබේ. මෙයින් අපේක්ෂා කෙරෙනුයේ,

1) ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම යි.
2) වියළීම පහසු කිරීම යි.
3) පරිරක්ෂක ද්‍රව්‍ය ගැල්වීම යි
4) ඒන්සයිම අක්‍රිය කිරීම යි.

30. කුකුළන්ට වැළඳෙන කොක්සිඩියෝසිස් රෝගයේ ව්‍යාධිජනකයා

1) බැක්ටීරියාවකි
2) ප්‍රොටොසෝවාවකි
3) වටපණුවෙකි
4) වෛරසයකි

31. ගැබිගත් ගව දෙනකගේ වියළි කාලය ආරම්භ කළ යුත්තේ ප්‍රසූතියට කොපමණ කාලයකට පෙර සිට ද?

1) සති 12
2) සති 10
3) සති 08
4) සති 04

32. නිරෝගී ගව දෙනකගේ මද ලක්ෂණ පෙන්නුම් කරන්නේ,

1) දින 14-17කට වරක් ය
2) දින 18 – 21කට වරක් ය
3) දින 24 – 27කට වරක් ය
4) දින 28 -30කට වරක් ය

33. දැනට ශ්‍රී ලංකාවේ කුකුළන් ඇති කිරීම සඳහා බහුලව යොදාගනු ලබන ක්‍රමය කුමක්ද?

1) තට්ටු ක්‍රමය
2) කූඩු ක්‍රමය
3) ඝන ආස්තරණ ක්‍රමය
4) අඩ සියුම් ක්‍රමය

34. පෙර අස්වනු සාධකයක් ලෙස සැලකිය නොහැක්කේ,

1) බෝගයට ගැලපෙන පසක් තෝරා නොගැනීම ය

2) බෝග පළිබෝධ හානිවලට ලක්වීම ය

3) අස්වනු නෙළීම සඳහා වඩාත් සුදුසු උපකරණය භාවිතා කිරීම ය

4) ජලය හිඟ වීම ය

35. පහත සඳහන් කෙටි යෙදුම් අතුරෙන් ආහාරයක ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිතිය දක්වන යෙදුම වන්නේ,

1) IPNS ය 2) SLS ය 3) SMI ය 4) ISO ය

36. අධික ලෙස ලාභ ඉපැයීමේ අරමුණින් ආහාර බාල කිරීම වර්තමානයේදී වැඩි වශයෙන් දැකිය හැකිය. ඊට නිදසුනක් නොවන අවස්ථාවක් වන්නේ,

1) ගම්මිරිස්වලට ගස් ලබු ඇට එකතු කිරීම ය.

2) කිරි පිටිවලට තිරිඟු පිටි එකතු කිරීම ය.

3) කිරිවලට ජලය මිශ්‍ර කිරීම ය.

4) ලුණුවලට අයඩීන් එකතු කිරීම ය.

37. පහත සඳහන් ආහාර කාණ්ඩ අතුරෙන් වැඩිපුර ම විටමින් A අඩංගු වන්නේ,

1) නෙල්ලි, දොඩම්, පැපොල් හා අඹ 2) තක්කාලි, මුං, සෝයා හා කුරක්කන්

3) රටකජු, නිවුඩු සහල්, අන්නාසි හා මාළු 4) කැරට්, පැපොල් , බිත්තර කහමද හා පලා වර්ග

38. බද්ද කිරීමක් සිදු කිරීමෙන් අනතුරුව පොලිතීන් කවරයකින් ආවරණය කරනුයේ,

1) පළිබෝධකයන් ඇතුළු වීම වැළැක්වීමට ය 2) ජලය උත්ස්වේදනය වීම වැළැක්වීමට ය

3) ජලය ඇතුළුවීම වැළැක්වීමට ය 4) සුළං හානිවලින් වැළැක්වීම ය

39. ආහාර ප්‍රමිති සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ,

A – පාරිභෝගිකයා ආරක්ෂා කරයි

B – නිෂ්පාදන ආයතනවල ඵලදායීතාව වැඩි වේ

C – ආහාරවල සත්‍ය තොරතුරු පාරිභෝගිකයාට දැන ගැනීමට හැකි වීම

මින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

1) A හා B පමණි 2) A හා C පමණි

3) B හා C පමණි 4) A,B හා C පමණි

40. සත්ත්ව පිෂ්ඨය ලෙස හැඳින්වෙන සීනි වර්ගය වනුයේ,

1) සෙලියුලෝස් ය 2) ලැක්ටෝස් ය

3) ග්ලූකෝස් ය 4) ග්ලයිකෝජන් ය

- **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. කෘෂි ව්‍යවසායවලින් වැඩි ප්‍රතිලාභ ගැනීම සඳහා භූමියේ නිරසාර පැවැත්ම මෙන්ම සත්ත්ව පාලනය හා බෝග වගාව කළමණාකරණ පිළිවෙත් පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

(1) බෝග වගාවේ දී මූලික බිම් සකස් කිරීම මගින් අත්වන වාසි දෙකක් සඳහන් කරන්න.

(2) a) පාංශු ඛාදනය යනු කුමක්ද?

b) පාංශු සංරක්ෂණය සඳහා යොදාගන්නා කෘෂිකාර්මික පිළිවෙත් දෙකක් සඳහන් කරන්න.

(3) a) බෝග වගාවේ දී ජල සම්පාදනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

b) බෝග වගාවේ දී යෙදාගන්නා භූගත ජල සම්පාදන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(4) පාංශු ජල සංරක්ෂණය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(5) දිගින් දිගටම බෝග වගා කිරීමේ දී පසෙන් ඉවත්වන මහා පෝෂක දෙකක් සඳහන් කරන්න.

(6) ඉන් එක් පෝෂකයක් පසෙන් අඩු වීමෙන් ශාක දක්වන ඌණතා ලක්ෂණ දෙකක් නම් කරන්න.

(7) ගව නිවාසයක් සැකසීමේ දී ඇතුළත් කළ යුතු ප්‍රධාන අංග හතරක් සඳහන් කරන්න.

(8) ගෙවතුවල නිදැලි ක්‍රමයට සුළු පරිමාණයෙන් කිකිළියන් ඇති කිරීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

(9) ගෙවත්තක වගා කිරීමට සුදුසු පොළොසියේ කුලයේ බෝග වර්ග දෙකක් සඳහන් කරන්න.

(10)පොළොසියේ කුලයට අයත්වන බෝගවල අඩංගු පෝෂ්‍ය පදාර්ථය නම් කරන්න.

02. බෝග වගාවේ දී කාලගුණික පරාමිති පිළිබඳව දැනුවත් වීම ඉතා වැදගත් වේ.



I a) රූප සටහනේ දැක්වෙන උපකරණය භාවිතා කරනු ලබන්නේ කුමන කාලගුණික පරාමිතිය මැනීම සඳහා ද?

b) මෙම රූපයේ A හා B කොටස් නම් කරන්න.

II යම් ප්‍රදේශයක පරිසර උෂ්ණත්වය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක දෙකක් නම් කරන්න.

III a) බෝග වගාවේ දී පාංශු වාතයේ වැදගත්කම් තුනක් සඳහන් කරන්න.

b)පාංශු වාතය දියුණු කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

03. ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදනවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා එක් පියවරක් ලෙස ආහාර පරිරක්ෂණය හඳුන්වා දිය හැකිය.

I a) පසු අස්වනු හානියට බලපාන පෙර අස්වනු සාධක හතරක් නම් කරන්න.

b) බෝග අස්වනු ප්‍රවාහනයේ දී දක්නට ලැබෙන දුර්වලතා හතරක් සඳහන් කරන්න.

II ගබඩා කිරීමේ දී හානි සිදුවිය හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

III a) ආහාරවල අගය වැඩි කිරීමේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

b) ආහාරවල අගය වැඩි කිරීමේ ක්‍රම දෙකක් ලියන්න.

04. ශාක ප්‍රචාරණයේ දී බීජ මෙන්ම වර්ධක කොටස් ද යොදා ගැනේ.

I බීජ මඟින් ශාක ප්‍රචාරණය කිරීමේ වාසි හතරක් සඳහන් කරන්න.

II a) බීජ ප්‍රරෝහණය සඳහා අවශ්‍ය සාධක හතරක් සඳහන් කරන්න.

b) බීජ සුප්තතාවයට හේතු දෙකක් සඳහන් කරන්න.

III පොළොව මට්ටමට නැමිය නොහැකි ශාක අත්තක අතු බැඳීම (ලේයර් කිරීම) සිදු කරන අයුරු නම් කළ රූප සටහනකින් දක්වන්න.

IV ස්වාභාවිකව ශාක ප්‍රචාරනය සිදුවන බෝගවලට උදාහරණ හතරක් සඳහන් කරන්න.

05. පළිබෝධ හානිය බෝග වගාවේ ඵලදායීතාවය අඩුවීමට බලපාන ප්‍රධාන සාධකයකි.

I a) ඉල් මැස්සා හානිකරන බෝග වර්ග හතරක් නම් කරන්න.

b) ඉල් මැස්සාගෙන් සිදුවන හානිය සඳහන් කරන්න.

II a) බෝග වගාවේ දී පාලිත තත්ත්ව ලබා දීම සඳහා සකස් කරනු ලබන ස්ථිර වගා ව්‍යූහ දෙකක් සඳහන් කරන්න.

b) නිර්පාංශු වගාවේ දී භාවිතා කරන රෝපණ මාධය දෙකක් සඳහන් කරන්න.

III ශාකයකට රෝගයක් වැළඳීමට සම්පූර්ණ විය යුතු සාධක තුනක් නම් කරන්න.

06. බෝග වගා කිරීමේ දී වැඩි නිශ්පාදනයක් ලබා ගනු පිණිස විවධ ගොවිතැන් ක්‍රම අනුමනය කරනු ලැබේ.

I a) "**සමෝධානිත ගොවිතැන**" යනු කුමක්ද?

b) සමෝධාන්ත ගොවිතැනෙහි වාසි හතරක් සඳහන් කරන්න.

II a) බෝග මාරුවේ දී රනිල බෝග යොදා ගැනීමෙන් ලැබෙන වාසිය කුමක්ද?

b) මෙම වගාව සඳහා යොදාගත හැකි රනිල බෝග වර්ග දෙකක් නම් කරන්න.

III a) කෘෂි වන වගාවේ වාසි හතරක් සඳහන් කරන්න.

b) කෘෂි වන වගාවක අඩංගු විය යුතු අංග මොනවාද?

07. පවුලේ පෝෂණය උදෙසා මෙන්ම ව්‍යාපාරයක් වශයෙන් ද ශ්‍රී ලංකාවේ ගව හා කුකුළු පාලනය සිදුකරනු ලැබේ.

I a) ගව දෙනකගේ ගැබ් කාලය කොපමණද?

b) ගව දෙනකගේ මද ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

c) කිරි ලබා ගැනීම සඳහා ඇති කරනු ලබන යුරෝපීය එළ ගව වර්ග දෙකක් සඳහන් කරන්න.

II පිරිසිදු බිත්තර නිෂ්පාදනයේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් හතරක් සඳහන් කරන්න.

III සත්ත්ව පාලනයේ දී යොදා ගනු ලබන සාන්ද්‍ර හා දළ ආහාර සඳහා උදාහරණ දෙක බැගින් නම් කරන්න.

* * * *